# නෙළුම් පොකුණේ පිපෙන මෙල්බර්න් නර්තන නළුව

සිසිර දිසානායක




මව් බිම හැර දා මෙරටට සංක්‍රමණය වීමට හේතු සොයා බැලුවහාත් ඒවා අප එකිනෙකාගේ පසුබිම අනුව වෙනස් වෙයි. කෙසේ වුවද අප බහුතරයක් මෙරටට පැමිණීමට හේතුව දරුවන් අධ්‍යාපන කටයුතු, නැතිනම් ඔවුන්ගේ අනාගතය පිළිබඳව මව් බිමේ පැවති තත්ත්වයයි. දරු පළ බලාපොරොත්තුවෙන් මෙහි පිරිසක් ද වෙයි.

දරුවන්ගේ අනාගතය වෙනුවෙන් ඔවුන් පැල වුණු මුල් භූමියෙන් හා එම පරිසරයෙන් මුලිනුපුටා මෙහි ගෙන ඒමේදී ඔවුනට මඟ හැරී ගිය දේ ද බොහෝය. ඔවුන්ගේ ඥාති මිත්‍ර සමාගම, ඇතැම් සාර ධර්ම, සිංහල කම, මෙන්ම හැදියාව ඒ අතරින් මුලට එයි. නොයෙකුත් කලා හෝ වෙනත් කටයුතු වෙනුවෙන් මෙහි පැමිණෙන මව්බිමේ කලාකරුවන්ගේත්, විද්වතුන්ගේත් අනෙක් වැඩිහිටියන්ගේත් එක් අවලාදයක් වූයේ අප මව්බිමේ සම්පත් මව්බිමට අහිමි කරනවා නොවේ ද යන්නයි. අනෙක් කාරණය වූයේ අපේ උරුමයන් ලෙසට කැටිකරගත් දරුවන් මේ නුහුරු පරිසරයේදී සංස්කෘතික සරණාගතයින් බවට පත් කරනවා නොවේද යන්නයි.

වාසනාවකට මෙන් බහු සංස්කෘතික කටයුතු අගයන ඊට පහසුකම් හා ඉඩ සළසාදෙන සමාජයීය පරිසරකටයි අප මේ අවතීර්ණ වී සිටින්නේ. අපගේ උප සමාජ කුලකයට අයත් සාමාජිකයිනගේ ප්‍රමාණාත්මක බව නිසාම විවිධ කුසලතා ඇති, විවිධ ශිල්පීය දක්ෂතා ප්‍රගුණ කළ වැඩිහිටියන්ගේ ප්‍රමාණයද අන් රටවල සංක්‍රමණික ශ්‍රී ලාංකිකයින්ගේ ප්‍රමාණයට වඩා ඉහළයි. එමෙන් ම එම හැකියාවන් සහජයෙන් උරුමකරගත් සහ එම කටයුතු ප්‍රගුණ කර ඉදිරිපත් කිරීමට උනන්දුවන දූ දරුවන් ප්‍රමාණය ද ඉහළයි. ප්‍රමාණාත්මක වැඩිවීමත් සමඟ නිතැතින්ම ඇතිවන තරඟකාරීත්වයත්, ඒ නිසා ඇතිවන "වඩාත් හොඳ දෙයක් වඩාත් හොඳින්" කිරීමේ ප්‍රවණතාවයත් සමාජයක ප්‍රගතිය සඳහා බෙහවින් බලපායි.



රසිකා කුලසිංහ නර්තනාචාර්යවරියගෙන් ශිල්ප හදාරන දූ දරුවන් පිරිස එවන් පරිසරයක සුසැදී "විශ්ව රංගායතනය" නම් වූ විල් තලයෙන් සුපිපි සියපත් පෙළක් වැන්න. ආචාර්යවරිය සිය ප්‍රභාව විහිදුවමින් නිරන්තරයෙන් තව තවත් මල් පුබුදුවන්නීය.

වසර 2002 දී සිසු සිසුවියන් දහදෙනෙකු කරගත් ඇරඹුණ විශ්ව රංගායතනයේ මේ වන විට ශිල්ප හදාරන සිසු - සිසුවියන් ප්‍රමාණයෙන් 200 ඉක්මවයි. එදා - මෙදා තුර "විශ්ව නර්තන රේඛා" ප්‍රසංග වාර හතරක්. ඉදිරිපත් කරමින් මේ ආ ගමනේ ඔවුන්ගේ එක් පැහැදිළි මං සළකුණක් වන්නේ "විජය - කුවේණී" නර්තන නළුවයි. අතීත කතා පුවතත් නර්තනය ඇසුරින් වේදිකාගත කිරීම සඳහා නර්තන අංග නිර්මාණය කර ඒවා පෙළ ගන්වා නර්තන වින්‍යාසය හා තිර රචනය කරගනිමින්, අංග රචනය කරගනිමින් හා සංවිධානය කරගනිමින් රසිකා කුලසිංහ ගත් උත්සාහය පළමු වරට මෙල්බර්න් නුවර බර්වුඩ් ප්‍රදේශයේ බීසන් සෙන්ටර් රංග ශාලාවේදී 2011 සැප්තැම්බර් මස හතරවන දා මල් පළ ගැන්විණ. දූ දරුවන් එකසිංහ පණහක් පමණ පිරිසකගේ දායකත්වයන් වේදිකාගත වූ මෙම නර්තන නළුව ප්‍රේක්ෂකයින්ට නැවුම් අත්දැකීම් විය. ආනන්දයෙන් ඇරඹී ප්‍රඥාවෙන් කෙළවර වූ අත්දැකීමක් විය.

පූජා නැටුමක්, ගෝත්‍රික නැටුම්, සටන්කාමී නැටුම්, කුඩා දරුවන්ගේ නැටුම්, බටහිර ආලිංගන නැටුම්, සාම්ප්‍රදායික වන්නම් හා ප්‍රශස්ති ඇසුරින් කළ නැටුම්, ගැමි නැටුම් බොලිවුඩ් නැටුම් යනාදී සියලු නැටුම් වර්ග ප්‍රේක්ෂකයාට නොදැනෙන්නට විජය කුවේණී පුවතට බද්ධ වනසේ නිර්මාණ ශීලීව ඉදිරිපත් විණ. " කුවේණී" නමින් හෙන්රි ජයසේනයන් නිර්මාණය කළ වේදිකා නාට්‍ය සිහිපත් කරවමින් එයි මානෙල් ජයසේන ශිල්පිනිය ගයමින් රඟ පෑ "සත් සියක්" ගීතය ද නර්ථනානුසාරයෙන් ඉදිරිපත් විණ. සෑම භූමිකාවකට ම උචිත පසුතල හා ආලෝකකරණය කටයුතු සියල්ල ප්‍රශස්ත මට්ටමේ වීය.

ඉංග්‍රීසි අකුරින් ලියැවුණු සිංහල කියවන, ගයන දූ දරුවන් පිරිසක් මනා සංයමයකින් යුතුව හසුරුවාගෙන කළා වූ විජය - කුවේණී නර්තන නළුව මෙල්බර්න් වලින් බැහැරව, ඕස්ට්‍රේලියාවෙන් බැහැරව වේදිකාගත කරන්නට මේ වන විට රසිකා කුලසිංහ නර්තනාචාර්යවරිය සූදානම් වන්නීය. ඉංග්‍රීසියෙන් කතා කරන ගයන, නටන හැසිරෙන සුදු පරිසරයක හැදුණ වැඩුන දූ දරුවන් සියයක් පමණ දෙනා මේ සඳහා ගුවන් ගතවන්නේ වෙන අන් දේශයකට නොවේ. මාතෘ භූමි, ශ්‍රී ලංකාවටයි. ඉංග්‍රීසියෙන් උගත් සිංහලෙන් හරඹ කොට ඔවුන් ශිල්ප දැක්වීමට සූදානම් වන්නේ සිය වැඩිහිටියන්ගේ වැඩිහිටියන්ටයි; සිය වැඩිහිටියන්ගේ මිතුරු මිතුරියන්ටයි. සිය ඥාතීන්ටයි. එහි වෙසෙන ඥාති සොයුරු සොයුරියන්ටයි. මිතුරු මිතුරියන්ටයි. මව් බිමේ වෙසෙන කලා කරුවන්ටයි. විද්වතුන්ටයි.

විජය - කුවේණී නර්තන නළුව මව් බිමේ ඉදිරිපත්වන්නේ එහි ඇති දැවැන්තම සහ නවීනතම රංගන ශාලාව වන "නෙළුම් පොකුණේ" දීයි. ඒ 2013 ජනවාරි පස්වෙනිදා මව්බිමේ වේලාවෙන් සවස හයටයි.

අප දන්නා තරමින් විදේශයක උපන් හෝ හැදුන වැඩුන දූ දරුවන් පිරිසක් නැවත ශ්‍රී ලංකාව වෙත ගොස් ඉදිරිපත් කරනා ප්‍රථම සංස්කෘතික උළෙලයි මේ. එක් අතකින් මෙය ශ්‍රී ලංකාවේ ඉතිහාසයට ද එක්වන වැදගත් අවස්තාවක් නොවේ ද?
කලින් කී පරිදි මව් බිමේ සම්පත් අන් රටවලට ගෙන යන්නේ යැයි අවලාද නැගූවන් එදින අපගේ හපනුන්ගේ හපන්කම් දෙස මුව හයා බලා හිඳිනු ඇත. මව් බිමේ හපනුන්ට නොදෙවෙනිව පානා හපන්කම්, ඔවුන්ගේ පටු සිතුවිලි හිරු දුටු පිණි සේ පහකර හරිනු ඇත.




# සුභාෂිතයෙන්



*නොහිම් සුවඳ විහිදෙන කස්තුරි — නිමල*
*උතුම් මුව නැබෙහි තිබි බඹ නැන — විකල*
*වීනම් මෙමට මහ බඹු පදවි යම් — කල*
*තබම් බොරු කියන දුදනන්ගෙ දිව — මුල*

**ගැදි කවිය :**

ණැන විකල බඹ
ඍනාහිම් සුවඳ විහිදෙන
නිමල කස්තුරි
උතුම් මුව නැබෙහි තැබි
යම් කල
මහ බඹ පදවි
මට විනම් (මම එය)
බොරු කියන දුදනන්ගෙ
දිව මුල තබම්.

මා පතින් පොතින් කස්තුරි ගැන අසා ඇති නමුත් කිසි විටෙක ඒවා දැක නැත. එහේයින් කස්තුරි කෙරෙන් සීමාවක් නැතිව සුවඳ විහිදෙතියි කියන කතාවේ ඇත්ත නැත්ත ගැන කියන්නට මම නොදනිමි. සීමාවක් නැති ව ගඳ හෝ සුවඳ විහිදුවන වෙනත් දෙයක් ඇති බවක් මා මෙතෙක් අසා නැත. කස්තුරි නිමල දෙයක් ද ? මම එය ද නොදනිමි. සමහර විට මහ බඹු එය උතුම් මුව නැබෙහි තබන්නට පෙර නිමලව තිබෙන්නට ඇත. නැන විකල වීම රෝගයකි. (මී මැස්මුරය මෙන්) එය බඹාට විටින් විට හැදෙන රෝගයක් ද නොහොත් සුව නොවන රෝගයක් ද යන්න ද තිර කොට කිව නොහැක. සතුන්ගේ අවයව සැලසුම් කොට තැන්පත් කිරීම ඔහුගේ වැඩක් නම් ඒ රෝගය තද වූ අවස්තාවල ඔහු කරන්නට ඇතැයි සිතිය හැකි තවත් වැඩ ඇති බව පෙනේ.

ලුනු උෟරු මස්, වියලි මුව හම් කී විට ලුනු උෟරන්, වියලි මුවන් යන අදහස එහි නැත. එහි ඇත්තේ ලුනු (උෟරු) මස් සහ වියලි (මුව) හම් යන අදහසය්. ඒ අනුව උතුම් මුව නැබ යනු මුවාගේ උතුම් බුරියය්.

මේ කවියාට යම්කිසි දවසක මහ බඹු පදවිය ලැබුනොත් ඔහු කස්තුරි තබන්නේ බොරු කියන දුදනන්ගේ දිව මුල ලු.

කස්තුරි ලබා ගත හැක්කේ මුවා මැරීමෙන් පසුය. ඒ අනුව කස්තුරි ගැනීම සඳහා දුදනා ද මැරිය යුතුය. ඔහු ඒ කාරිය සඳහා තෝරා ගන්නේ බොරු කියන දුදනන්ය; බොරු නොකියන දුදනන් නොවේ; බොරු කියන සුදනෝ නැද්ද ? යතිවරයන් සුදනන් සේ ගත හොත්, ගැහැනියකට අතවර කොට වරදකරු වී විසි වසරක සිර දඬුවමක් ලැබූ යතිවරයා උසාවියේ දී කීවේ බොරු නොවිය හැකි ද ?

මේ කවියා හිතන්නේ බොරු කියන එකා දුදනා ය කියා විය යුතුය. මේ මිනුමු ක්‍රමය අනුව සුදනකු සොයා ගැනීම කලුනික සෙවීමක් විය හැකිය. මේ ලියන මම සුදනෙක් ද ? නැත. නැත. මම නොයෙක් විට හතරැස් බොරු ද කියා ඇත්තෙමි.

ඔබට මහ බඹු පදවි ලැබුනොත් ඔබ කස්තුරි තබන්නේ කොතැන ද ?

වි. ක. ධර්මබන්ධු